# දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
# රුහුණ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2022 පුනර් පරීක්ෂණය.

2022 නොවැම්බර් / දෙසැම්බර්

## භූවිසා 2.1 – සම්පත් සංවර්ධනය හා සැලසුම්කරණය

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න. කාලය : පැය තුනයි (03)

---

1. "සම්පත්" යන්න අර්ථ දක්වා, සම්පත් පිළිබඳ ඇගයුම පුළුල් වීම කෙරෙහි බලපාන සාධක <u>4ක්</u> නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

2. "සම්පත් උපයෝජනය, සංවර්ධනය සහ සංරක්ෂණයෙහි ලා මිනිසා තීරණාත්මක සාධකයකි." උචිත නිදසුන් දක්වමින් ඉහත ප්‍රකාශය විමර්ශනය කරන්න.

(ලකුණු 20)

3. ශ්‍රී ලංකාවේ සම්පත් පරිහරණය ආශ්‍රිත ව හඳුනාගත හැකි ගැටලු <u>5ක්</u> උචිත නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

4. ගෝලීය ජල අර්බුදය (Global Water Crisis) හේතු කොට ගෙන පැන නැගී ඇති අහිතකර ප්‍රතිවිපාක <u>5ක්</u> නිදසුන් සහිතව පැහැදිළි කරන්න.

(ලකුණු 20)

5.

I. වත්මන් ගෝලීය ජනගහනය කොපමණදැයි පෙන්වා දී, අධිකතම ජනගහනයක් වෙසෙන කලාපය, හා රටවල් පෙන්වා දෙන්න.

(ලකුණු 03)

II. අධික ජනගහනය පාදක කොටගෙන, එම රටවල් මුහුණ පා ඇති ගැටලු 5ක් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

III. ඉහත අධික ජනගහනය පාලනය සඳහා යොදා ගත හැකි විසඳුම් 2ක් පෙන්වා දෙන්න.

(ලකුණු 03)

6. තිරසර සංවර්ධනය (Sustainable Development) ළඟාකර ගැනීමේ දී සංවර්ධනය වෙමින් පවතින රටවලට බලපෑම් කරන සාධක 5ක් සහ වර්තමානය වන විට එම රටවල් එම බාධක දුරු කර ගැනීමට ගෙන තිබෙන ක්‍රියා මාර්ග 5ක් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

7.

I. සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය යනු කුමක් ද? අර්ථ දක්වන්න.

(ලකුණු 02)

II. සංවර්ධනය වෙමින් පවතින රටවල් සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග 6ක් නිදසුන් සමගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 18)

8. පහත සඳහන් මාතෘකා අතුරින් 2ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

I. ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)

II. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)

III. ශ්‍රී ලංකාවේ වන සම්පත්

IV. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)

(ලකුණු 10 x 02= 20)

--------@@@@@@@@------------